**රිදීගම ප්‍රාදේශීය සභාව**
**කුරුණෑගල දිස්ත්‍රික්කය**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 31 දින ද විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2019 ජුනි 20 දින ද සභාපතිවරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට රිදීගම ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | රම්බඩගල්ල පුස්තකාලය සංවර්ධනය සඳහා දරා තිබුණු රු.814,642 ක් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | අදාල වියදම් ප්‍රාග්ධනිත කළ යුතු වේ. | මෙම වටිනාකම ඉදිරි වර්ෂයේ දී ගිණුම්ගත කිරීමට කටයුතු කරමි. |
| (ආ) | 2005 පෙබරවාරි 28 දින මිලදී ගෙන තිබූ රු. 165,000 ක් වටිනා ටේලරයක් ගිණුම්ගත කර නොතිබුණි. | ස්ථාවර වත්කම් යටතේ ගිණුම් ගත කළ යුතු වේ. | මූල්‍ය ප්‍රකාශනවල මෝටර් රථ හා කරත්ත යටතේ මෙම ටේලරයේ වටිනාකම ගිණුම්ගත නොවීම පිළිබඳ තවදුරටත් කරුණු සොයා බලා වාර්තා කිරීමට කටයුතු කරමි. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ හා ඊට පෙර වර්ෂ වල මිල දී ගෙන තිබූ රු. 296,305 ක් වටිනා ලීබඩු හා උපකරණ ගිණුම්ගත කර නොතිබුණි. | ස්ථාවර වත්කම් යටතේ ගිණුම් ගත කළ යුතු වේ. | ඉදිරි වසරේ මූල්‍ය ප්‍රකාශන වාර්තාවෙන් එය නිවැරදි කරමි. |

**1.4** **අනුකූල නොවීම්**

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| **නීති, රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව** | **අනුකූල නොවීම** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|---|
| 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන ) රීති 207 | පුස්තකාල පොත් සහ සඟරා මිලදී ගැනීමේ දී ලියාපදිංචි සැපයුම් ආයතන 4 න් එක් ආයතනයකින් පමණක් මිල ගණන් කැඳවා රු.400,000 ක් වටිනා පොත් සහ සඟරා මිලදී ගෙන තිබුණි. | රීති ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | මින් ඉදිරියට මූල්‍ය පරිපාලන රීති 207 අනුව ප්‍රසම්පාදන ක්‍රියාවලිය මගින් පුස්තකාල පොත් මිලදී ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකරමි. |

**02.** **මූල්‍ය සමාලෝචනය**

**2.1** **මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.21,066,405 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.17,727,479 ක් විය.

**2.2** **ආදායම් පරිපාලනය**

**2.2.1** **ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම්**

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම් , බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2018 වර්ෂය<br>ඇස්තමේන්තුගත ආදායම්<br>රු. 000 | 2018 වර්ෂය<br>බිල්කළ ආදායම්<br>රු. 000 | 2018 වර්ෂය<br>රැස්කළ ආදායම්<br>රු. 000 | 2018 වර්ෂය<br>දෙසැම්බර් 31 දිනට මුළු හිඟය<br>රු. 000 | 2017 වර්ෂය<br>ඇස්තමේන්තුගත ආදායම්<br>රු. 000 | 2017 වර්ෂය<br>බිල්කළ ආදායම්<br>රු. 000 | 2017 වර්ෂය<br>රැස්කළ ආදායම්<br>රු. 000 | 2017 වර්ෂය<br>දෙසැම්බර් 31 දිනට මුළු හිඟය<br>රු. 000 |
|---|---|---|---|---|---|---|---|---|
| I. වරිපනම් හා බදු | 4,223 | 4,346 | 4,615 | 2,639 | 3,083 | 3,777 | 3,358 | 2,904 |
| II. කුලී | 8,030 | 13,445 | 13,670 | 328 | 4,917 | 5,635 | 5,466 | 553 |
| III. බලපත්‍ර ගාස්තු | 1,933 | 1,207 | 1,231 | 47 | 1,683 | 1,612 | 1,718 | 171 |
| IV. වෙනත් ආදායම් | 85,137 | 75,406 | 84,956 | 23,852 | 77,322 | 69,535 | 69,531 | 37,390 |
| එකතුව | 99,323 | 94,404 | 104,472 | 26,866 | 87,005 | 80,559 | 80,073 | 41,018 |

### 2.2.2 වරිපනම් හා බදු

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | වසරකට වඩා වැඩි හිඟ වරිපනම් බදු රු.1,524,440 ක් විය. | ප්‍රාදේශිය සභා පනතේ හා ප්‍රාදේශිය සභා (මූල්‍ය හා පරිපාලන) රීති ප්‍රකාරව හිග මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | හිඟ ශේෂය අයකර ගැනීමට කටයුතු කරමි. |
| (ආ) | වසරකට වඩා වැඩි හිඟ අක්කර බදු රු.218,291 ක් විය. | හිග ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | ශේෂ අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා බව දන්වා සිටිමි. |

**2.2.3 කුලී**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතු බදු කුලී හා කඩකුලී පිළිවෙලින් රු.280,498 ක් හා රු.47,760 ක් විය. | හිඟ කුලී මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | හිඟ මුදල් ඉදිරියේදී අය කර ගැනීමට කටයුතු කරමි. |

**2.2.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු උසාවි දඩ රු.2,538,586 ක් හා මුද්දර ගාස්තු රු.16,116,256 ක් විය. | හිඟ ගාස්තු අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | හිඟ මුදල් ගෙන්වා ගැනීම සඳහා ක්‍රියාමාර්ග ගන්නා බව දන්වමි. |

**03. මෙහෙයුම් සමාලෝචනය**

**කොන්ත්‍රාත් පරිපාලනය**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2017 සහා අරමුදල් රු.399,458 ක් මගින් හේවාවිස්ස පුස්තකාලය අලුත්වැඩියාව හා සංවර්ධනය කිරීමේදී වැඩ විෂය 3 කට අදාළව ඉටුකල යුතු වැඩ කොටස් නිසි පරිදි ඉටුකර නොතිබිය දී රු.377,976 ක් ගෙවා තිබුණි. | ගිවිසුම් ප්‍රකාරව වැඩ අවසන් කර ගත යුතු වේ. | ව්‍යාපෘතියට සම්බන්ධ වූ අදාළ අබලන්වූ කොටස් නැවත පරීක්ෂා කර බලා මහා සභාවේ අනුමැතිය සහිතව ඉදිරියේදී ප්‍රතිසංස්කරණය කරන බව දන්වා සිටිමි. |
| (ආ) | 2017 වර්ෂයේ සභා අරමුදල් රු.198,871 ක් භාවිතයෙන් නියංගම ප්‍රධාන මාර්ගයේ ඉතිරි කොටස කොන්ක්‍රීට් යොදා සංවර්ධනය කර තිබුණු අතර මාර්ගයේ වර්ග මීටර් 40.5 ක මතුපිට ගැලවී යාමද, වර්ග මීටර් 79.18 ක ප්‍රමාණයක පිපිරීමද, වර්ග මීටර් 3.54 ක කොන්ක්‍රීට් තට්ටුව කැඩී වෙන්වද තිබුණි. | ගිවිසුම් ප්‍රකාරව වැඩ අවසන් කරවා ගත යුතු වේ. | විගණනයට භාජනය වන දින එනම් 2018 නොවැම්බර් 28 වන විට නඩත්තු කාලය අවසන්ව පැවති අතර 10% රඳවුම් මුදල් ගෙවා ඇත. එබැවින් ව්‍යාපෘතියට සම්බන්ධ වූ අදාළ අබලන්වූ කොටස් නැවත පරීක්ෂා කර බලා මහ සභාවේ අනුමැතිය සහිතව ඉදිරියේදී ප්‍රතිසංස්කරණ කරන බව දන්වා සිටිමි. |